00025

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (නාට්‍ය හා රංගකලා ) උපාධි වැඩසටහන - පස්වන මට්ටම

අවසාන පරීක්ෂණය - 2014

ESU4117 - ප්‍රාථමික අධ්‍යාපනය

කාලය - පැය තුනයි.

---

දිනය - 2014.02.28 වේලාව - ප.ව.01.30 - ප.ව. 04.30

---

I වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, II වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## I වන කොටස

01. ප්‍රාථමික අධ්‍යාපනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

02. 'අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා' සහ 'අභිමත ඉගෙනුම් නිපුණතා' අතර වෙනස කෙටියෙන් පැහැදිලි කරන්න.

03. ප්‍රාථමික අවධියේ ළමුන් සඳහා ප්‍රවේශ නිපුණතා වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ අභිමතාර්ථ තුනක් (03) සඳහන් කරන්න.

04. ගුරුකේන්ද්‍රීය අධ්‍යාපනය ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් වෙනස්වන අයුරු නිදසුන් දක්වමින් කෙටියෙන් සාකච්ඡා කරන්න.

05. 'ආරක්ෂාව සඳහා ළමා අයිතිය' යනුවෙන් අදහස් කරන්නේ කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

06. මහත්මා ගාන්ධිගේ දර්ශනය වත්මන් ප්‍රාථමික විෂයමාලාවට බලපා ඇති ආකාරය කෙටියෙන් දක්වන්න.

07. 1997 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේදී ප්‍රාථමික අධ්‍යාපනය සඳහා හඳුන්වා දුන් වෙනස්කම් තුනක් (03) දක්වන්න.

08. ප්‍රාථමික පාසල් දරුවාගේ පෞරුෂ සංවර්ධනය යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක්දැයි යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)



2/

## II වන කොටස

09. i. සම්පත් පුද්ගලයකු ලෙස ප්‍රාථමික පාසල් ගුරුවරයාගේ භූමිකාව විස්තර කරන්න. (ලකුණු 08)

ii. ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාකාරිත්වයේ ඵලදායිතාව වැඩිදියුණු කිරීම සඳහා විදුහල්පතිවරයාගේ භූමිකාව පහත සඳහන් අංශ යටතේ සාකච්ඡා කරන්න.

අ) ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය නියාමනය කිරීම

ආ) පන්ති කාමර කළමනාකරණය

ඇ) සම්පත් දායකයකු වශයෙන් (ලකුණු 12)

10. i. 'සැමට අධ්‍යාපනය' යන සංකල්පය පැහැදිලි කරන්න. (ලකුණු 04)

ii. නිදහසින් පසු සැමට ප්‍රාථමික අධ්‍යාපනය සැපයීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව ගෙන ඇති පියවර පැහැදිලි කරන්න. (ලකුණු 08)

iii. සැමට ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීමට බාධාකාරී වන සාධක කවරේදැයි විභාග කරන්න. (ලකුණු 08)

11. i. ඇගයීම හා තක්සේරුකරණය යන සංකල්පය හඳුන්වා දෙන්න. (ලකුණු 04)

ii. ප්‍රාථමික ශ්‍රේණිවලට අදාළ තක්සේරු කිරීමේ ක්‍රියාවලියේ නව ප්‍රවණතා සාකච්ඡා කරන්න. (ලකුණු 08)

iii. 'ප්‍රාථමික ශ්‍රේණියක උගන්වනු ලබන ගුරුවරයකු ඇගයීමට වඩා තක්සේරු කිරීමේ කාර්යයක නිරත වෙයි." මෙම කියමනට පක්ෂව හෝ විපක්ෂව හේතු ඉදිරිපත් කරන්න. (ලකුණු 08)

12. i. ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාව පදනම් වූ ජාතික පොදු නිපුණතා හත (07) පැහැදිලි කරන්න. (ලකුණු 14)

ii. තෝරාගත් එක් නිපුණතාවක් අත්කර ගැනීම සඳහා සිසුන් සැමට කළ හැකි ක්‍රියාකාරකමක් යෝජනා කරන්න. (ලකුණු 06)

13. i. ප්‍රාථමික අධ්‍යාපනයේ 'සමෝධානිත ප්‍රවේශය' යන්නෙන් කුමක් අදහස් වන්නේ දැයි නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

ii. ඔබ කැමති ප්‍රාථමික ශ්‍රේණියක පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළව ඕනෑම තේමාවක්/මාතෘකාවක් තෝරාගෙන එහි සමෝධානිත ප්‍රවේශය යොදාගෙන ඇති අයුරු සාකච්ඡා කරන්න. (ලකුණු 12)

14. පහත සඳහන් මාතෘකා දෙකක් (02) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. අවිධිමත් තක්සේරුකරණය

ii. ප්‍රාථමික පන්තිකාමර සඳහා ඉගැන්වීමේ ශිල්ප ක්‍රම

iii. ප්‍රාථමික අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා පාසල් ප්‍රජාවේ දායකත්වය

iv. ප්‍රාථමික අධ්‍යාපනය සඳහා දාර්ශනික මතවාදවල බලපෑම

හිමිකම් ඇව්රිණි.